# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 858 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 21/05/2024<br>පැය 1545 |

**මාධ්‍ය නිවේදනය**

**01. මනුෂ්‍ය ඝාතනයක් - අම්බලන්ගොඩ පොලිස් වසම.**

2024.05.20 වන දින අළුයම් කාලයේ අම්බලන්ගොඩ පොලිස් වසමේ උඳුවරාගොඩ ප්‍රදේශයදී ඇසිඩ් ගැසීමක් හේතුවෙන් තුවාල ලැබූ කාන්තාවක් බලපිටිය රෝහලට රැගෙන එමින් සිටියදී මියගොස් ඇති බවට අම්බලන්ගොඩ පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 59 ක් වූ උඳුවරාගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

කලක සිට පැවති ඉඩම් ආරවුලක් හේතුවෙන් මෙම අපරාධය සිදුකර ඇති බවට විමර්ශනයේදි අනාවරණය වී ඇත.

මෘත ශරීරය බලපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ඝාතනයට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා අම්බලන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. කොකේන් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය.**

2024.05.20 වන දින සවස් කාලයේ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් හා ශ්‍රී ලංකා රේගු නිලධාරීන් එක්ව ගෝතමාලා රටේ සිට මෙරටට ගුවන් යානයකින් පැමිණි පුද්ගලයෙකු පරික්ෂා කර එම පුද්ගලයා සන්තකයේ තිබූ කොකේන් ග්‍රෑම් 483ක් සමඟ අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන මෝදර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. හෙරොයින් සමඟ විදේශ ජාතික කාන්තාවක් අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය.**

2024.05.20 වන දින උදෑසන කාලයේ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් හා ශ්‍රී ලංකා රේගු නිලධාරීන් එක්ව පකිස්ථානයේ සිට ගුවන් මඟින් මෙරටට පැමිණි කාන්තාවක් පරික්ෂා කර එම විදේශ කාන්තාව හෙරොයින් කිලෝග්‍රෑම් 02 ග්‍රෑම් 450ක් සමඟ අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 43 ක් වන විදේශ ජාතික කාන්තාවකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - හලාවත පොලිස් වසම.**

2024.05.20 වන දින දහවල් කාලයේ හලාවත පොලිස් වසමේ කුරුස පාඩුව වැල්ල මුහුදු තීරයට ගොඩ ගසා සිටි නරක් වූ නාඳුනන පිරිමි මෘත ශරීරයක් ඇති බවට හලාවත පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත. උස අඩි 05 යි අඟල් 06 ක් පමණ වන සමාන්‍ය සිරුරකි. උඩුකයට රතු, කළු හා සුදු කොටු අත්දිග කමිසයක් ඇද සිට ඇති අතර සිරුර නරක් වී ඇති බැවින් වයස් ප්‍රමාණයක් හෝ වෙනත් කිසිදු රූප විස්තරයක් හඳුනාගැනීමට නොහැක.**

මෘත ශරීරය හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හලාවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. මාරක රිය අනතුරක් - අච්චුවේලි පොලිස් වසම.**

2024.05.20 වන දින උදෑසන කාලයේදී අච්චුවේලි පොලිස් වසමේ පුත්තූර් මීසාලේ මාර්ගයේ වාදරාවත්ත ප්‍රදේශයේදී පුත්තූර් දෙස සිට මීසාලේ දෙසට ධාවනය වූ වෑන් රථයක් රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ දකුණු පසට ගමන් කර මාර්ගය අයිනේ නවතා තිබූ පාපැදියක සිටි කාන්තාවකගේ ගැටී අසල තිබූ ගසකද ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදිකාරිය යාපනය රෝහලටත්, වෑන් රථයේ ගමන් කල දෙදෙනෙකු පලාලි යුද හමුදා රෝහලට ඇතුලත් කිරීමේදී පාපැදිකාරිය මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 23 ක් වූ පුත්තූර් ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය යාපනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට අදාල වෑන් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. අච්චුවේලි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**